www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 16 S

නම ..............................................

ඉස්ලාම් ධර්මය

කාලය පැය දෙකයි

උපදෙස් : ★ ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. "රිසාලත් " යන්නෙහි සිංහල අර්ථය
    1. ඒකීය දේව වාදය 2. ආදේශ කිරීම 3. අවසන් දිනය විශ්වාස කිරීම 4. ප්‍රතික්ෂේප කිරීම.

02. ඊමානයෙහි දෙවන කරුණ වන්නේ,
    1. මලාඉකාවරුන් විශ්වාස කිරීම 2. අල්ලාහ් විශ්වාස කිරීම.
    3. මරණයෙන් පසු ජීවිතය විශ්වාස කිරීම. 4. පාරිශුද්ධ ආගම් විශ්වාස කිරීම.

03. මව්කිරි පමණක් බොන අවුරුදු දෙකක් වයසැති පිරිමි දරුවෙකුගේ මූත්‍රා
    1. දැඩි නජීස් 2. සැහැල්ලු නජීස් 3. සමාන්‍ය නජීස් 4. නජීස් නැත.

04. මිඋරාජ් සිදුවීම සිදු වූ මාසය
    1. රජබ් 2. දුල්හජ් 3. සපර් 4. සව්වාල්

05. "මලකුල් මව්ත්" යනු
    1. ජිබ්රීල් (අලෛ) 2. මීකායිල් (අලෛ) 3. ඉස්රාෆීල් (අලෛ) 4. ඉස්රායීල් (අලෛ)

- **නිවැරදි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද යොදන්න.**

06. "දික්ර් කල්බ්" සිතින් මෙනෙහි කරන දික්ර් වේ. ( )
07. "ලෙයිලතුල් කද්ර්" මුහර්රම් මාසයේ ඒවි. ( )
08. සලාතය පිළිබඳව මරණයෙන් පසු විනිශ්චය කරනු නොලැබේ. ( )
09. මහකිල්ල දුරලන්නට ස්නානය කළ යුතුයි. ( )
10. සුනබයන්ගේ හම පදමට වේලා භාවිතා කළ හැක. ( )

- **යා කරන්න**

| | |
|---|---|
| 11. රිල්වාන් (අලෛ) | සව්මි |
| 12. මආද් | පාප ක්ෂමාව |
| 13. උපවාසය | වහ්දානියියත් |
| 14. තව්බා | මරණයෙන් මතු ජීවිතය |
| 15. අල්ලාහ් | ස්වර්ගයේ අධිපති |

- **හිස්තැන් පුරවන්න.**

16. උපවාසයේ යෙදෙන්නන් ඇතුල්වන ස්වර්ග දොරටුව ..................................................... වේ.
17. අපි ............................................... පමණක් ප්‍රාර්ථනා කළ යුතු වේ.
18. සුනබ ලේ ................................................ නජීස් වේ.
19. "ලෙයිලතුල් කද්ර්", මාස .................................. වඩා ශ්‍රේෂ්ඨ වේ.
20. දිවෙන් උච්චාරණය කරන දික්ර් අරාබියෙන් .................................................. ලෙස හැඳින්වේ.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) i. ඊමානයෙහි කොටස් දෙක ලියන්න.
ii. පිරිසිදුකම පිළිබඳව හදීසයක්ලියන්න.
iii. ස්නානයෙහි වර්ග දෙක කුමක් ද?
iv. අප ඉටුකරන (අතිරික්ත) සුන්නත් උපවාස දෙකක් ලියන්න.
v. "දික්ර්" හි කොටස් දෙක මොනවාද?
vi. රමළාන් උපවාසය අනිවාර්ය නොවූ දෙදෙනෙක් ලියන්න.
vii. "කබ්ර් " හි දී ප්‍රශ්න කරනු ලබන මලා ඉකාවරයා කවුද?
viii. "ඊමාන් ඉක්තියාරි" යනු කුමක්ද? (ල. 2 x 8 = 16)

(02) i. උපවාසයෙන් ලැබෙන ආනිසංස තුනක් ලියන්න. (ල. 03)
ii. මලා ඉකාවරුන් 4 දෙනෙකුගේ නම් ලියා ඔවුන් සතු වගකීම් හතර ද ලියන්න. (ල. 04)
iii. "දූඩි නජීස්" පිරිසිදු කරන ආකාරය ලියන්න. (ල. 04)

(03) i. නජීස් වර්ග තුන කුමක් ද? (ල. 03)
ii. සලාතය මඟින් අපට ලැබෙන ආනිසංස 04 ක් ලියන්න. (ල. 04)
iii. ප්‍රාර්ථනාවේ දී අනුගමනය කළ යුතු කරුණු 04 ක් සඳහන් කරන්න. (ල. 04)

(04) i. හදීසයේ සඳහන්වන පරිදි උපවාසකයෙකු සතුටු විය හැකි අවස්ථාවන් මොනවාද? (ල. 03)
ii. සුන්නත් ස්නානයන් 04 ක් ලියන්න. (ල. 04)
iii. අනවශ්‍ය වියදම් පිළිබඳව සඳහන් වන අල්කුර්ආන් වැකියක් ලියන්න. (ල. 04)

05) i. තයම්මුම් බිඳවැටෙන කරුණු 03 ක් ලියන්න. (ල. 03)
ii. වුළු පිළිබඳව පැවසෙන කුර්ආන් වැකියක් / හදීසයක් ලියන්න. (ල. 04)
iii. ඊමානිය (විශ්වාස කළ යුතු) කරුණු 04 ක් ලියන්න. (ල. 04)

(06) i. රිසාලත්හි අන්තර්ගත වන කරුණු 04 මොනවාද? (ල. 03)
ii. නබිවරුන් හතරක් සඳහන් කර ඔවුන් හට ලබාදුන් පාරිශුද්ධ ග්‍රන්ථ ද ලියන්න. (ල. 04)
iii. " ලා ඉලාහ ඉල්ලල්ලාහු මුහම්මදුර් රසූලුල්ලාහ්" යන්නෙහි සිංහල අර්ථය ලියන්න. (ල. 04)

(07) i. "ජායිස්ගුණාංගය" යනු මොනවාද? (ල. 03)
ii. තයම්මුම් කිරීම සඳහා වූ හේතු 02 ක් ලියන්න. (ල. 04)
iii. අනිවාර්ය ස්නානය ඉටුකළ යුතු ආකාරය පැහැදිළි කරන්න. (ල. 04)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk